ස්වදේශ කටයුතු චක්‍රලේඛ :08/2024

මගේ අංකය එච්ඒ/1/2/2022
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.

2024.04. 30

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්
ප්‍රාදේශීය ලේකම්වරුන්.

**රාජ්‍ය වෙසක් මහෝත්සවය සැමරීම - ශ්‍රී බුද්ධ වර්ෂ 2568**

1. ශ්‍රී බුද්ධ වර්ෂ 2568 රාජ්‍ය වෙසක් මහෝත්සවය වෙනුවෙන් 2024 වර්ෂයේ මැයි මස 21 දින සිට 27 දින දක්වා කාලය **"වෙසක් සතිය"** ලෙස අමප/24/0579/620/013 හා 2024.04.01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ප්‍රකාශයට පත්කර ඇත. ඒ අනුව මෙවර රාජ්‍ය වෙසක් උත්සවය 2024 මැයි මස 21 දින මාතලේ ධර්මරාජ පිරිවෙන් විහාරස්ථානය කේන්ද්‍ර කොට ගනිමින් පැවැත්වේ.

2. සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලයේ මහ පෙන්වීම අනුව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව, මධ්‍යම පළාත් සභාව, මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ආරක්ෂක අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය ඇතුළු රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල සහාය ඇතිව වෙසක් උත්සවය උත්කර්ෂවත් අයුරින් දිවයින පුරා පැවැත්වීමට ද සියලු කටයුතු සංවිධානය කර ඇත.

    මෙවර රාජ්‍ය වෙසක් උළෙලේ තේමා පාඨය,

    **"අත්තනො ව අවෙක්ඛෙය්‍ය කතානි අකතානි ච"** වේ.

    **(අනුන් කළ දේ නොව තමන් කළ දේ ගැන විමසිලිමත් වෙමු)**

3. ඒ අනුව සම්බුදු තෙමඟුල සමරන 2024 මැයි මස 21 දින සිට 27 දින දක්වා වන වෙසක් සතිය තුල සියලුම රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල, නිවාසවල බෞද්ධ කොඩිය ඔසවා තැබීමටත්, එම ගොඩනැඟිලි පරිසර හිතකාමී වෙසක් සැරසිලි වලින් අලංකාර කිරීමටද තීරණය කර ඇත.

4. මෙම අතිඋත්කර්ෂවත් වෙසක් සතිය තුල දිවයිනේ සියලු විහාරස්ථාන කේන්ද්‍ර කරගෙන ආධ්‍යාත්මික සංවර්ධනයට මුල්තැන දෙමින් ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩලවල පූර්ණ මාර්ගෝපදේශකත්වයෙන් යුතුව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල සම්බන්ධීකරණයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් සභා හා පළාත් පාලන ආයතන හා සියළුම ආගමික සිද්ධස්ථාන ඇතුළු වෙනත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන, පුද්ගලයින් ඇතුලත්ව සියළුම ජනතාව සහභාගී කරවා ගැනීමට හැකි වන පරිදි වෙසක් සතිය වඩාත් අර්ථවත් කිරීම සඳහා පහත තේමාවන් යටතේ දිවයින පුරා වෙසක් වැඩසටහන් පැවැත්වීමට ද තීරණය කර ඇත.

### I. 2024.05.21 සංස්කෘතික වැඩසටහන්

පැරණි බෞද්ධ හා හෙළ කලා ශිල්ප පිළිබඳ මනා අවබෝධයක් ලබා දීමට අවශ්‍ය දේශන, සම්මන්ත්‍රණ, වැඩමුළු සංවිධානය කිරීම, සදහම් චාරිකා වැඩසටහන්, පිණ්ඩපාත පින්කම් පැවැත්වීම, ආගමික, සංස්කෘතික, අධ්‍යාපනික හා පුරාවිද්‍යාත්මක වැඩසටහන් හා ප්‍රදර්ශන පැවැත්වීම, සර්ව ආගමික දහම් පාසල් හා පාසල් දරුවන් ද අනෙකුත් ආයතනද සම්බන්ධ කර ගනිමින් භක්ති ගීත හා බොදු ගීත ගායනා වැඩසටහන් සංවිධානය කිරීම.

## II. 2024.05.22 පරිසර සංරක්ෂණ වැඩසටහන්

බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම් ඇසුරින් පරිසර හිතකාමී පුරවැසියන් බිහිකිරීම සඳහා බුදු දහම හා පරිසරය පිළිබඳ දේශන, වැඩමුළු පැවැත්වීම, පරිසරය රැකගැනීම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, විහාරස්ථාන, පාසල්, පොදු ස්ථාන, කාර්යාල, නිවාස, වැඩිහිටි හා ළමා නිවාස, රෝහල් ආදී පොදු ස්ථානවල ශ්‍රමදාන පැවැත්වීම, රුක් රෝපණ වැඩසටහන් සංවිධාන කිරීම හා ඔසු උයන් පිහිටුවීම.

## III. 2024.05.23 සීල භාවනා පිංකම් (වෙසක් පොහෝ දින වැඩසටහන)

මෙදින වෙසක් පුර පසළොස්වක පොහෝ දිනය බැවින් ප්‍රතිපත්තිමය පූජාවන්ට මුල්තැන දෙමින් සෑම විහාරස්ථානයකම සීල භාවනා වැඩසටහන් සංවිධානය කිරීම. එම වැඩසටහන් වලට දහම් පාසල්, පාසල් සිසුන් හා තරුණ පිරිස් සම්බන්ධ කර ගැනීම තුළින් ඔවුන්ට ප්‍රායෝගික අවබෝධය ලබා දීමට කටයුතු කිරීම.

## IV. 2024.05.24 සාරධර්ම ප්‍රවර්ධන හා ආගමික සහජීවන වැඩසටහන්

I සමස්ත දිවයිනම ආවරණය වන පරිදි බෞද්ධ, හින්දු, මුස්ලිම්, ක්‍රිස්තියානි දරුවන්ට තම ආගම්වලට අදාළව සාරධර්ම, වත්පිළිවෙත් හා සම්ප්‍රදායන් පිළිබඳ අවබෝධය ලබා ගැනීමටත්, ආගම් කෙරෙහි ගෞරවය ඉහළ නංවාලීමටත්, ආගමික සහජීවනය ඉහළ නැංවීමටත් වැඩසටහන් සංවිධානය කිරීම. ඒ සඳහා අදාළ ආගමික නායකයින් හා ආගමික ස්ථාන සම්බන්ධීකරණය කරමින් දහම් පාසල් මට්ටමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

II පැසැල් හා දහම් පාසල් දරුවන් වෙනුවෙන් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පැවැත්වීම, හෙළ බොදු සිරිත් විරිත්වල වටිනාකම පිළිබඳව තරුණ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්, උපදේශන වැඩසටහන් පැවැත්වීම හා සාරධර්ම පෙරහර වැඩසටහන් සංවිධානය කිරීම.

## V. 2024.05.25 සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සඳහා සම්බුද්ධ දේශනාවට අනුව පවත්වන වැඩසටහන්

නොමිලේ වෛද්‍ය සායන, ලේ දන්දීම, අක්ෂි සායන පැවැත්වීම, ඇස් දන්දීම හා ශරීර කොටස් දන්දීම සඳහා ලියාපදිංචි කර ගැනීම ආදී වැඩසටහන් හා නොමිලේ ඇස් කණ්ණාඩි බෙදා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## VI. 2024.05.26 අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන්

සෑම විහාරස්ථානයක්ම හා දහම් පාසලක්ම කේන්ද්‍ර කර ගනිමින් බෞද්ධ සිරිත් විරිත් හා චාරිත්‍ර විධි පිළිබඳ දහම් පාසල් දරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම, ධර්ම දේශනා, ධර්ම සාකච්ඡා පැවැත්වීම, දානමය පිංකමකදී ස්වාමීන්වහන්සේලා වැඩම කරවා දානය පිළිගැන්වීම හා ධර්ම දේශනා පිරිත් පිංකම් ආදී පුණ්‍ය කටයුතු සිදු කරන ආකාරය ප්‍රායෝගිකව පුහුණු කිරීම මෙමඟින් අපේක්ෂා කෙරේ.

## VII. 2024.05.27 භික්ෂු හා සිල්මාතා පුහුණු වැඩසටහන්

පිරිවෙන් වල අධ්‍යාපනය ලබන ස්වාමීන්වහන්සේලා සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම, පිරිවෙන් අධ්‍යාපනය ලබන මූලික පහසුකම් සපයා ගැනීමට දුෂ්කර ස්වාමීන් වහන්සේලා සඳහා ප්‍රදේශයේ සම්පත් දායකයින් හඳුනාගෙන අවශ්‍ය පහසුකම් සැලසීම.

5. 2024 මැයි මස 22, 23 හා 24 යන දින තුනෙහි දිවයින පුරා ඇති සියලුම සත්ත්ව ඝාතකාගාර හා සුපිරි වෙළෙඳසැල්හි අලෙවි කුටිද ඇතුළත්ව සියලුම මස් මාංශ අලෙවිසැල් වසා තැබීම හා දිවයින පුරා සියලුම සුරාසැල්, සියලුම මත්පැන් අලෙවි ස්ථාන හා සමාජ ශාලාද වසා තැබීමට කටයුතු කිරීම.

6. එසේම, බුදුන් වහන්සේගේ සම්බුදු තෙමඟුල සිහිකිරීම සඳහා ලෝකවාසී බෞද්ධ ජනතාව සමඟ එක්ව ශ්‍රී ලාංකික ජනතාව ආමිස හා ප්‍රතිපත්ති පූජාවන්ට මූලිකත්වය ලබාදෙමින් මෙවර සමරන වෙසක් උත්සවය සම්ප්‍රදායික උළෙලකටම සීමා නොවී, එහි වත්පිළිවෙත් සහ ආගමික හර පද්ධතීන් වෙසක් උළෙලෙන් පසුවත් ඉදිරියට තිරසාර ලෙස පවත්වාගෙන යාමට හැකි වන පරිදි කටයුතු සංවිධානය කිරීම.

ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

පිටපත්

1. අතිගෞරවනීය මහානායක ස්වාමීන්වහන්සේ - ගෞරවනීය දැනගැනීම සඳහා
2. ගරු සභාපති/ ගරු ලේකම් ස්වාමීන්වහන්සේ, සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය - ගෞරවනීය දැනගැනීම සඳහා
3. ජනාධිපති ලේකම් - කරු.දැ.ස.
4. අග්‍රාමාත්‍ය ලේකම් - කරු.දැ.ස.
5. ලේකම්, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය - කරු.දැ.ස.
6. බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් - කරු. අ.ක.ස.
7. සුරාබදු කොමසාරිස් ජනරාල් - කරු. අ.ක.ස.
8. සභාපති, පාරිභෝගික ආරක්ෂණ අධිකාරිය - කරු. අ.ක.ස.